ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| --- | --- |
| දිනය | 2016/07/21 |

## 2016 ජූනි මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (ජා.පා.මි.ද.) (2013=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2016 මැයි මාසයේ දී වාර්තා කළ සියයට 5.3 හි සිට 2016 ජූනි මාසයේ දී සියයට 6.4 දක්වා ඉහළ ගියේය. 2016 ජූනි මස ලක්ෂ්‍යමය උද්ධමනය කෙරෙහි ආහාර කාණ්ඩය මෙන්ම ආහාර නොවන කාණ්ඩය ද දායක විය.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි වෙනස 2016 මැයි මස වාර්තා වූ සියයට 2.7 හි සිට 2016 ජූනි මස දී සියයට 3.1 දක්වා ඉහළ ගියේය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සැලකූ විට 2016 මැයි මාසයේ වාර්තා වූ දර්ශක අංක 113.7 සිට 2016 ජූනි මාසයේ දී දර්ශක අංක 116.1 දක්වා සියයට 2.1 ක වැඩිවීමක් වාර්තා වේ. මෙම වැඩිවීම සඳහා ආහාර කාණ්ඩයේ අයිතමයන්හි මිල ගණන් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු විය. එළවළු, අමුමිරිස්, සහල්, නැවුම් මත්ස්‍ය, සීනි, අර්තාපල් සහ රතුළූණු මිල ගණන් මාසය තුළ දී ඉහළ ගියේය. ආහාර නොවන කාණ්ඩය තුළ රෙදිපිළි හා පාවහන්; නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන; ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු; සන්නිවේදන; ආපනශාලා හා හෝටල් සහ විවිධ භාණ්ඩ හා සේවා යන උපකාණ්ඩවල මිල ගණන් 2016 ජූනි මාසය තුළ දී ඉහළ ගියේය. මේ අතර මධ්‍යසාර පාන හා දුම්කොළ උප කාණ්ඩයෙහි මිල ගණන් 2016 ජූනි මාසය තුළ දී පහළ ගියේය.

කෙසේ වුවද, සෞඛ්‍ය; ප්‍රවාහන; විනෝදාත්මක හා සංස්කෘතික සහ අධ්‍යාපන උප කාණ්ඩ මාසය තුළ දී නොවෙනස්ව පැවතුණි.

මේ අතර ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන ජා.පා.මි.ද. මූලික උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත, 2016 මැයි මස පැවති සියයට 7.2 සිට 2016 ජුනි මස වන විට සියයට 7.5 දක්වා ඉහළ ගියේය. වාර්ෂික සාමාන්‍ය ජා.පා.මි.ද. මූලික උද්ධමනය 2016 මැයි මස වාර්තා වූ සියයට 5.0 හි සිට 2016 ජුනි මස වන විට සියයට 5.3 දක්වා ඉහළ ගියේය.



**ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම**
**පදනම : 2013 = 100**

| වසර | මාසය | දර්ශක අගය | මාසික % වෙනස | ලක්ෂ්‍යමය % වෙනස | වාර්ෂික සාමාන්‍ය % වෙනස |
|---|---|---|---|---|---|
| 2015 | ජනවාරි | 112.8 | 3.9 | 9.4 | |
| | පෙබරවාරි | 108.9 | -3.5 | 5.7 | |
| | මාර්තු | 107.6 | -1.2 | 4.3 | |
| | අප්‍රේල් | 107.0 | -0.6 | 2.8 | |
| | මැයි | 108.0 | 0.9 | 3.0 | |
| | ජූනි | 109.1 | 1.0 | 2.7 | |
| | ජූලි | 108.9 | -0.2 | 1.8 | |
| | අගෝස්තු | 108.4 | -0.5 | 1.9 | |
| | සැප්තැම්බර් | 108.4 | 0.0 | 1.9 | |
| | ඔක්තෝබර් | 109.2 | 0.7 | 3.0 | |
| | නොවැම්බර් | 112.0 | 2.6 | 4.8 | |
| | දෙසැම්බර් | 113.2 | 1.1 | 4.2 | 3.8 |
| 2016 | ජනවාරි | 112.0 | -1.1 | -0.7 | 2.9 |
| | පෙබරවාරි | 110.8 | -1.1 | 1.7 | 2.6 |
| | මාර්තු | 110.0 | -0.7 | 2.2 | 2.4 |
| | අප්‍රේල් | 111.6 | 1.5 | 4.3 | 2.6 |
| | මැයි | 113.7 | 1.9 | 5.3 | 2.7 |
| | ජූනි | 116.1 | 2.1 | 6.4 | 3.1 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව